# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1807/5 - 2013 අප්‍රේල් මස 22 වැනි සඳුදා - 2013.04.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### මැදිරිගිරිය ප්‍රාදේශීය සභාවේ සභාපති ධුරයේ පුරප්පාඩුව පිරවීම

උතුරු මැද පළාතේ පළාත් සභාවට තේරී පත්වීම හේතු කොට ගෙන මැදිරිගිරිය ප්‍රාදේශීය සභාවේ සභාපති ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

සභාපති වන වික්‍රමආරච්චිගේ සම්පත් ශ්‍රී නිලන්ත වික්‍රමආරච්චි නම් වූ සභාපති අයත් වන්නාවූ එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) කාල පරිච්ඡේදය ඇතුළත සභාපති වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත්වන්නා වූ ද ඒ මැදිරිගිරිය ප්‍රාදේශීය සභාවේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා තෙබුවත්තේ ගමරාලලාගේ ආනන්ද ශ්‍රී ධම්සේන මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

මැදිරිගිරිය ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී හතුරුසිංහලාගේ ඉන්දික රංජන් හතුරුසිංහ වන මම තෙබුවත්තේ ගමරාලලාගේ ආනන්ද ශ්‍රී ධම්සේන මහතා මැදිරිගිරිය ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් තෝරා පත් කරගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

එච්. අයි. ආර්. හතුරුසිංහ,<br>
තේරීම්භාර නිලධාරි,<br>
මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව.

2013 අප්‍රේල් මස 08 වැනි දින,<br>
මැතිවරණ කාර්යාලය,<br>
පොළොන්නරුව.

05 - 129/1

1A - G 17566— 350 (2013/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## මැදිරිගිරිය ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධුරයේ පුරප්පාඩුවක් පිරවීම

උතුරු මැද පළාතේ පළාත් සභාවට තේරී පත්වීම හේතු කොට ගෙන මැදිරිගිරිය ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

වික්‍රමආරච්චිගේ සම්පත් ශ්‍රී නිලන්ත වික්‍රමආරච්චි නම් වූ සභිකයා අයත් වන්නා වූ එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) කාල පරිච්ඡේදය ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත්කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් ඒ මැදිරිගිරිය ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වශයෙන් තේරී පත්වීම සඳහා සුදුසුකම් ලත් තැනැත්තෙකු නාම යෝජනා කිරීමට, මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා සුදුසුකම් ලත් තැනැත්තෙකු වන උඩහමුල්ලමුදියන්සේලාගේ සමිත් චන්ද්‍ර උඩහමුල්ල මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

මැදිරිගිරිය ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී හතුරුසිංහලාගේ ඉන්දික රංජන් හතුරුසිංහ වන මම, උඩහමුල්ලමුදියන්සේලාගේ සමිත් චන්ද්‍ර උඩහමුල්ල මහතා මැදිරිගිරිය ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත් කරගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

එච්. අයි. ආර්. හතුරුසිංහ,
තේරීම්භාර නිලධාරී,
මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව.

2013 අප්‍රේල් මස 08 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
පොළොන්නරුව.

05 - 129/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.